පාර්ලිමේන්තු ප්‍රශ්න මාලා අංකය :- 492

ආයතනයේ නම : වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 492

நிறுவனத்தின் பெயர் :' வனப் பாதுகாப்புத் திணைக்களம்

பாராளுமன்றத்தின் அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கை தொடர்பில் நிலையியற் கட்டளை 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புகளையும் எடுத்த நடவடிக்கைகளையும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No : 492

Name of the institution: Department of Forest Conservation

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the committee on public Accounts in terms of Standing Order NO. 199(4)

කාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492
ආයතනයේ නම : වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

2023 මූල්‍ය වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය හා ප්‍රගති සමාලෝචන වාර්තාවෙන් ඉදිරිපත් කර ඇති දුර්වලතා	ඒ සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග / වර්තමාන තත්වය
පළමු කොටස : 65.00	
1. 2022.12.13 දිනැති අංක 2022/5 දරණ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2025.09.01 දින සිට දෙපාර්තමේන්තුවේ සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය ආරම්භ කරන ලද අතර , එදින සිට එය යාවත්කාලීන කරමින් පවත්වාගන යනු ලැබේ.
2. බඩු වට්ටෝරු ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	දෙපාර්තමේන්තුවේ සියලුම අංශයන් හි ආංශික බඩු වට්ටෝරු ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යන අතර , ප්‍රධාන ගබඩාවේ බඩු වට්ටෝරු ලේඛනය ද යාවත්කාලීනව පවත්වාගෙන යාම සිදුවේ.
3. පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	දෙපාර්තමේන්තුවේ සියලුම අංශයන් හි ආංශික පාරිභෝගික ද්‍රව්‍යය ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යන අතර , ප්‍රධාන ගබඩාවේ පාරිභෝගික ද්‍රව්‍යය ලේඛනය ද යාවත්කාලීනව පවත්වාගෙන යාම සිදුවේ.
4. හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	දෙපාර්තමේන්තුවට අදාළව සිදුවන සියලුම හානිවලට අදාළව , හානි පිළිබඳ ලේඛනය ප්‍රධාන කාර්යාලයෙන් යාවත්කාලීනව පවත්වාගෙන යාම සිදුවේ.
5. අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	2023 මූල්‍ය වර්ෂය සඳහා අවදානම් ලේඛනයක් සකස්කර තිබුණි. එම අවදානම් ලේඛනය පාදක කර ගනිමින් එම වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම ද පිළියල කර තිබුණි.2026 මුදල් වර්ෂය සඳහා ද අවදානම් ලේඛනයක් සකස් කර ඇත.
6. සාමාජික ණය ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත. (CC10)	යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ලැබේ.
7. 2004.5.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගනක මෘදුකාංගයට අදාළ මුරපද තුන්මසකට වරක් වෙනස්කර නොතිබුණි.	මුරපදය තුන්මසකට වරක් සංශෝදනය කර ඇති අතර , ඉදිරියේ දී ද එය නියමිත කාලය තුළ අඛණ්ඩව සිදු කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත.
8. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත්කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	බොහෝ විගණන විමසුම් කලාප කාර්යාලවලට, දිසාවන කාර්යාලවලට සහ විවිධ අංශවලට අදාල ඒවා වන බැවින් තොරතුරු ගෙන්වා ගැනීමේ දී ඒ සඳහා කාලයක් ගත වේ. එවැනි විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු සැපයීම ප්‍රයෝගිකව අපහසු කාර්යයකි. හැකි සෑම අවස්ථාවකම අවම කාලයක් තුළ පිළිතුරු සැපයීමට කටයුතු කෙරේ.
9. 2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1	2023 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත. දෙපාර්තමේන්තුවට අයත් ශාඛා/උප කාර්යාල 207ක

ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ.756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි.	පමණ සමීක්ෂණ කටයුතු සිදු කළ යුතුව ඇති බැවින් යම් කාල ප්‍රමාදයක් සිදුව ඇත. ඉදිරියේ දී නියමිත කාල සීමාවන් ඇතුළත ම සමීක්ෂණ කටයුතු අවසන් කිරීමට කටයුතු කරමි.
10. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත , ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2024 මුදල් වර්ෂයේ දී 01/2020 දරන රා.මු.ව යෙන් සංශෝධිත මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන අනුව , නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණ රාජකාරී කටයුතු අවසන්කර , වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ,ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.
11. සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	දෙපාර්තමේන්තුව සතු , අයිතිය නොමැති. වාහනවල අයිතිය පවරාගැනීමට 2023 වර්ෂයවන විටත් ක්‍රියාවලිය ආරම්භ කර තිබුණි. වෙනත් රජයේ හා රාජ්‍ය නොවන ආයතන සතු දෙපාර්තමේන්තුව විසින් ප්‍රයෝජනයට ගනු ලබන වාහන 81ක් හඳුනාගෙන ඇත. ඉන් වාහන 30 ක් මේ වන විට පවරා ගැනීම සඳහා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟතාවය ලබා ගැනීමට අවශ්‍ය MTA 06 ආකෘති පත්‍ර අදාළ ආයතන වෙත යොමු කර ඇති අතර එයින් වාහන 14 ක ලේඛන අත්සන් කර ලබා දී ඇති බැවින් පවරා ගැනීමේ ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. අනෙකුත් පවරා ගැනීමට ඇති වාහන සඳහා අවශ්‍ය ලේඛන සකස් කර එම ආයතන වෙත යොමු කර වන සංරක්ෂක ජනරාල්ගේ නමට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. මේ අතරින් වාහනවල ලියාපදිංචි සහතිකයේ සඳහන් ආයතන/ අමාත්‍යාංශ මේ වන විට වසා දමා ඇති අතර ඒ සඳහා විකල්ප ක්‍රියාමාර්ග ගත යුතුව ඇත. තවද මේ අතරින් බොහෝ වාහන අබලන් තත්ත්වයේ ඇති අතර දීර්ඝ කාලයක් ධාවනය කර නොමැති බැවින් එම වාහන සඳහා පසුගිය හිඟ ආදායම් බලපත්‍ර ලබා ගැනීම ආදී වැඩි කාලයක් ගත වන කටයුතු සපුරා ගැනීමට සිදුව ඇත. එසේම මේවන විටත් වෙනත් ආයතන සතු වාහන 04 ක් දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන ඇත.
12. සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරුකර නොතිබුණි.	නිල වාහන හැර අනෙකුත් සියලුම සංචිත වාහන සඳහා රාජ්‍ය ලාංඡනය යොදා ඇත.
13. වාහනයක් ගර්හිත වී මාස 08කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	2022 වර්ෂයේ අපහරණය කිරීමට හඳුනාගත් වාහන අතුරින් 167 ක් තක්සේරු කරන ලදී. එයින් 2023 වර්ෂයේ වාහන 37 ක් සම්පූර්ණ වාහන ලෙස විකිණීම සඳහා විවෘත ටෙන්ඩර් කැඳවූ අතර ඉන් වාහන 12 ක් වැඩිම මිළ ගණන් ඉදිරිපත් කළ ටෙන්ඩර්කරුවන්ට ප්‍රදානය කර ඇත. එයින් අබලි ද්‍රව්‍ය ලෙස අපහරණය කිරීමට නියමිතව තිබූ වාහන සඳහා ඊට අදාළ ක්‍රියාවලිය සිදුකරමින් පැවතුණි. ඒ අනුව 2023 වර්ෂයේ සිට මේ දක්වා වාහන 79 ක් අපහරණය කර ඉවත් කර ඇත. තවද 2025 ජූලි මාසයේ දී නැවත අපහරණ ක්‍රියාවලිය මුල සිට ආරම්භ කරන ලද අතර එහිදී පළමු පියවර වශයෙන් කලාප කාර්යාල හා දිසා වන කාර්යාල 20 කට අයත් වාහන 119 ක් අපහරණය සඳහා හඳුනාගෙන ඇත. එහි දෙවන පියවර ලෙස එම වාහන තක්සේරු කිරීම සඳහා සියලු කම්ටු පත් කර ඇති අතර තක්සේරු වාර්තා ලද විගස අපහරණ ක්‍රියාවලිය සම්පූර්ණ කර අවසන් කිරීමට නියමිතය.ඉදිරියේ දී දෙපාර්තමේන්තුව සතු වාහනයක් ගර්හිත වුවහොත් , එය හඳුනාගත් දින සිට මාස 08කට වඩා අඩු කාලයක දී අපහරණය කිරීමට අවශ්‍යය පියවර ගැනීමට නිලධාරීන් දැනුවත් කර ඇත.

14. රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව නිසි කටයුතු සිදුකර නොතිබුණි.	2020 සිට මේ දක්වා වාහන අනතුරු සම්බන්ධ ගොනු 35ක් පවතී. i. ඉන් ගොනු 5ක මු.රෙ. කටයුතු අවසන් කර ඇත. ii. ඒ අතුරින් 2020 සිට 2023 දක්වා හදිසි අනතුරු ගොනු 17ක කටයුතු අවසන් කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නොවිසඳී පවතින හානි හා පාඩු ගොනු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට පත් කරන ලද මු.රෙ. 104(4) ප්‍රකාරව පරීක්ෂණ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කරන ලද අතර එහි නිර්දේශ පරිදි කටයුතු සිදුකරමින් පවතී. iii. තවත් හදිසි අනතුරු ගොනු 09ක මු.රෙ.104(4) අවසන් වාර්තාව සම්බන්ධ කටයුතු අවසන් අදියරේ සිදු කරමින් පවතී. iv. 2025.10.27 දින හා 2026 වර්ෂයේ මේ වන තෙක් වාර්තා වුණු හදිසි අනතුරු 04ක කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.
15. බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට පිළියෙළකර සහතික කර විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි.	සිගාස් වැඩසටහන යාවත් කාලීන කිරීමේ දී ඇති වූ ගැටලුවක් නිසා වසරේ මුල් කාර්තුව තුළ බැංකු සැසඳුම් පිළියෙළ කිරීම ප්‍රමාද වුවද ; අනතුරුව නියමිත දිනට ඉදිරිපත් කර ඇත.2025 මුදල් වර්ෂයේ සිට ප්‍රාදේශීය කාර්යාලයන් හි බැංකු සැසඳුම් , නියමිත දිනට සකස්කර Googol Form එකක් මඟින් විගණනය සඳහා ඉදිරිපත් කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
16. සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට පැවත එමින් තිබූ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර නොතිබුණි.	අක්‍රිය බැංකු ගිණුම් 31න් 27ක් මේවන විට වසා දමා ඇත. ඉතිරි බැංකු ගිණුම් 04 වසා දැමීමට අවශ්‍යය ලිපි ලේඛන භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත.
17. බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	2023 වර්ෂයට අදාළව , බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සියල්ල මේවන විට නිරවුල් කර ඇත.
18. ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දැරීම සිදුව තිබුණි.	ප්‍රතිපාදන කළමනාකරණය කර ගනිමින් හා නිරන්තර අධීක්ෂණයෙන් යුතුව වියදම් කරන ලෙසත් , එමඟින් සීමාව ඉක්මවා වියදම් දැරීම වැලැක්වීමටත් නිලධාරීන් දැනුම්වත් කර ඇත.
19. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	අත්තිකාරම් බී ගිණුමේ හිඟ ණය ශේෂ , අදාළ ණය ගැතියන්ගේ ඇපකරුවන්ගෙන් / විශ්‍රාම හෝ මරණ පාරිතෝෂිතයෙන් අයකර ගැනීමට හැකි සෑම විටකදීම කටයුතු කර ඇත.එලෙස අයකරගත නොහැකි ණය මුදල් සඳහා අදාළ ණය ගැතියන්ට නඩු පැවරීම සඳහා නීතිපති උපදෙස් විමසා ඇත.
20. පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ පරිසර හානි වැලැක්වීම සඳහා ගනු ලබන තැම්පතු නිශ්චිත බලපත්‍ර කාල සීමාව අවසන් වන තෙක් රඳවා තබා ගැනීමට සිදු වීමත් බලපත්‍ර කාල සීමාව වසර 2-10 දක්වා කාල පරාසයක් තුළ විහිදීමත් නිසා මෙසේ සිදුව ඇත.

දෙවන කොටස :

1. ආයතනයේ පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි.	පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සකසා ප්‍රදර්ශනය කර ඇත.එය යාවත්කාලීන කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. අධීක්ෂණ කටයුතු එක් එක් අංශයේ වන සංරක්ෂක විසින් සිදු කරනු ලබයි.
2. සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම්ගතව නොතිබුණි.	රා.ප.ව.02/2018 (1) න් වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම තවදුරටත් අවශ්‍ය නොවන බව දන්වා ඇත.
3. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	මුදල් , ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම් විසි නිකුත් කරන ලද අංක BD/CBP/01/01/05/2022 හා 2023.01.27 දිනැති අය වැය වක්‍රලේඛ අංක 01/2023 අනුව , කාර්යක්ෂමතා කඩඉම් වැනි අත්‍යාවශ්‍යය පුහුණු වැඩසටහන් සඳහා පමණක් හැකියා ප්‍රවර්ධනය කිරීම් යටතේ ප්‍රතිපාදන වෙන්කරන ලෙස දන්වා ඇත. ඒ අනුව , 2023 වර්ෂයේ කාර්යක්ෂමතා කඩඉම් සඳහා අවශ්‍යය දෙමළ භාෂා පුහුණුව හා නවක වන ක්ෂේත්‍ර නිලධාරීන් සඳහාවන සේවාරම්භක පුහුණුව යන පුහුණු වීම් පමණක් පවත්වන ලද අතර , සෙසු පුහුණු වැඩසටහන් ඉහත වක්‍රලේඛයේ උපදෙස් අනුව සිදු නොකරන ලදී. 2026 මුදල් වර්ෂයේ දී නිසි පරිදි පුහුණු අවස්ථා ලබා දීමට පුහුණු සැලසුම් සකස් කර ඇති අතර , නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා පිළිබඳව විමසිම් සිදුකර ඒ අනුව ක්‍රියාකාරී සැලසුම සකස් කොට , පුහුණු වැඩසටහන් ලබා දෙමින් පවතී.
4. ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ /අහිතකර මට්ටමේ විය.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය සාධාරන මට්ටමේ මතයක් දක්වා ගෙන ඒමට අවශ්‍යය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.
5. නිලධාරීන්ගෙන් රජයට සිදුවූ පාඩු වෙනුවෙන් මු.රෙ.156(1) ප්‍රකාරව අයකිරීම් කර නොතිබුණි.	යම් කිසි නිලධාරියකුගේ ප්‍රමාදයක් , නොසැලකිල්ලක් , වරදක් හෝ වංචාවක් හේතුකොටගන රජයට යම් අලාභයක් සිදු වූ බවට හානි පාඩු කමිටුව විසින් තීරණයකළ අලාභයන් අදාළ නිලධාරීන්ගෙන් අධිභාරකර ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. පරීක්ෂයේ ස්වභාවය අනුව කාල සීමාවන් දීර්ඝ විය හැකිය.
6. උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිසි පරිදි ස්ථාන මාරුකර යැවීමට කටයුතු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ පවතින ඉහළ පුරප්පාඩු සංඛ්‍යාව හේතුවෙන් අනුප්‍රාප්තික නිලධාරීන් පැමිණි පසු නිලධාරීන්ගේ ස්ථාන මාරු කටයුතු සිදු කරනු ලබයි.

වෛද්‍ය දම්මික පටබැඳි
පරිසර අමාත්‍ය